ශිවනඩිපාදම් යනුවෙන් හඳුන්වන බ්‍රහ්මීන් මෙම පාද ලාංඡනය ශිව නම් වු සියල්ල විනාශ කරන දෙවියන් විසින් තැබුවක් යයි කියති. යුද්ධ දිනා ගනිමින් පැමිණි හින්දුහු මෙම කන්ද කාලාන්තරයක් මුළුල්ලේ සියළුම විශ්වාසයන්ගේ පුද බිමක්ව පැවති බව දුටුවෝය. ගංගා නම් ගඟෙන් එතෙර සිට පැමිණි දිළිදු විජ්ජා කරුවෝ හිමාලය, එනම් ශිවගේ සුප්‍රසිද්ධ වාසස්ථානය අවට ඔවුන් දැක පුරුදු පැලෑටි මෙම කන්ද බෑවුමේද, කඳුරු හා එළිමහන් පිටි වලද වැවී තිබෙනු දුටුවෝය. අදද මිනිසුන් සොයන පරිදි

***<u>කොළඹ ආසන්න පතලක තිබී ඉන්දියා-වේ මෙලියාපූර්හි තිබෙන දේවදූතයාගේ දණහිසේ ලාංඡනයට ඉතා සමීප සළකුණක් සහිත ගලක් හමු වූයෙන් මෙම ලාංඡන සම්ප්‍රදාය සිතනවාට වඩා පුළුල්ව පැතිර ගිය එකක් බව පෙනේ.</u>***

එදා ඔවුහු ද එහි සන්සේවි පැලෑටිය නැතහොත් ජීවන ගස සෙවුහ. ඔවුන් අතර එදා මේ ස්ථානය ප්‍රසිද්ධව තිබුණේ දෙව්ලොවට නගින මාර්ගය ලෙසය. කඳු මුදුනේ ඇති පා සළකුණ මත හිස තබන ඔනෑම කෙනෙකුට සදාකාලික සැපතකට ශිවගේ ආශීර්වාදය ලැබෙන බව විශ්වාස කරන හෙයින් ශ්‍රීපාද ස්ථානය ශිව දෙවියන් වැඩ සිටින ස්ථානයක් ලෙස සැලකීම තේරුම් ගැනීමට එතරම් අපහසු කරුණක් නොවේ. මේ අතර කිතුනුවන්ද මෙය ඔවුන්ගේ අධ්‍යාත්මික පියා වන සාන්ත තෝමස්ගේ යයි නැතහොත් බයිබලයේ එන පරිදි ඉතියෝපියානු කැන්ඩාස් රැජින යටතේ සිටි බලසම්පන්න සේවකයාගේ යයි කියමින් ඉතා රළු ලෙස දබරයට පැටළුණහ. එම ඉතියෝපියානු මහා පුරුෂයාට මේ කන්ද මුදුනේ තිබුණු රාජකාරිය කුමක්ද යන්න ගැන මාතුල පැහැදිලි අදහසක් නැත. නමුත් කොළඹ ආසන්න පතලක තිබී ඉන්දියාවේ මෙලියාපූර්හි තිබෙන දේවදූතයාගේ දණහිසේ ලාංඡනයට ඉතා සමීප සළකුණක් සහිත ගලක් හමු වූයෙන් මෙම ලාංඡන සම්ප්‍රදාය සිතනවාට වඩා පුළුල්ව පැතිර ගිය එකක් බව පෙනේ. එහි ඉතිහාසය පිළිබඳව වැඩි දුර කරුණු ඉදිරිපත් කිරීමෙන් වැලකීම වඩා හොඳය!

දෙවන බුදුවරයාගේ පැමිණීම සිදුවූ කාලයේ, එනම් දේව දූත යුගයට සියවස් විස්සකට පෙරාතුව සිටම මේ කඳු මුදුන සමන්ත කූට නැතහොත් සමනල කන්ද ලෙස ප්‍රසිද්ධව පැවතුණි. ක්‍රි.පූ.2386 දී රාමගේ සහෝදරයා වන ලක්ෂ්මන විසින් දිවයින යටත් කරගත් බව කියනු ලැබේ. ඔහු සමන් යන නමින් දේවත්වයට පැමිණ අදටත් සමන්ත කූටය ආරක්ෂා කරන බව කියති. ඔහුට පුද පූජා පවත්වන දේවාල දෙකකි. එකක් කන්ද මුදුනේද, අනෙක වඩාත් ගාම්භීර මුහුණුවරකින් කන්ද පාමුල රත්නපුරයට ආසන්නවද ඉදිකොට ඇත.

බෝගස් වලින් වට වී ඇති දේවාලයේ දොර-කඩ විශාල ඇත් දළ දෙකක් සවි කොට තිබේ. මැදුර තුල රන්මුවා දුනු හා ඊතල රැගත් දෙවියන්ගේ කහ පැහැති පිළිරුව තනා ඇත. නැගෙනහිරට මුහුණ ලා කන්ද බෑවුම දිගට පිපී ඇති රොඩොඩෙන්ඩ්‍රන් මල් ඔහුට උපහාර පිණිස එලූ අලංකාර රතු පලසක් මෙන් දිස්වේ. ජනප්‍රවාදයේ දිග හැරෙන පරිදි සමන් දෙවියන් බුදුන වහන්සේ ලංකාවට වඩින පුවත අසා බුදුන්ගේ පා සළකුණ තමන්ගේ භාරයේ පවතින කඳු මුදු-න් තබන මෙන් ඉල්ලා ඇත. බුදුන් වහන්සේ රැස්ව සිටි දේව සභාව මධ්‍යයේ සිට නැගෙනහිර දෙස බලා වඩු කාර්මිකයෙකුගේ මිම්මෙන් රියනකට අඟල් තුනහමාරකට අඩු දිගින් යුත් පා සළකුණ තබමින්, මේ සළකුණ ලංකාව බුදුන්ගේ උරුමයක් බව කියා පාන මුද්‍රාවක් ලෙස පවතිනු ඇත. ඒ අනුව බුදු දහම මෙහි සශ්‍රීකව වැඩෙනු ඇත. යි පවසා තිබේ.

ශ්‍රීපාද කන්ද පිළිබඳ තවත් විස්තර ලබන කලාපයෙන්

පරිවර්තනය ශ්‍රියා කුමාරසිංහ


# ALG & ASSOCIATES

**FOR ALL YOUR TAXATION, ACCOUNTING & BOOKKEEPING NEEDS**

- Individual & Business Income Tax Returns (Partnership, Trust & Company)
- Self Managed Superannuation Funds
- Accounting & Bookkeeping
- Business Activity Statements (GST Returns) & Instalment Activity Statements
- Company Secretarial
- Business Consultants
- Tax Planning

**Arjuna Gunawardena CPA B.Ec**
Registered Tax agent

ABN 63 865 123 157
PO Box 1335 Glen Waverly 3150
Tel - (03) 9802 3322
Fax - (03) 9802 6654
Mobile - 0438 194 827
Email - aplus_ms@bigpond.net.au



# Have Peace of Mind....talk to us

**ඔබේ සිතට සැනසුම ලබාගන්න . . . අදම අප අමතන්න**



ඔබේ මූල්‍ය අවශ්‍යතාවයන්ට
අපෙන් නොමිලේ උපදෙස් හා සේවා රැසක්

**Aplus Mortgage Solutions**

We will help you to solve your financial needs.

We deal with reputed banks and other financial institutions.
We are confident of giving the fitting product to meet your needs.

**We can help you with**
Home Loans
Business Loans
Construction Loans
Lines of Credit
Debt Consolidation
Investment Loans
Low Doc and No Doc Loans
Commercial Loans
Zero Deposit Loans

We can also help you with a FREE Mortgage Health Check to see whether your present arrangements are adequate

MIAA

Call our mortgage consultant
Arjuna Gunawardena CPA B.Ec
on (03) 9802 3322 0438 194 827
or e mail us aplus_ms@bigpond.net.au

Ace Financial Solutions Pty Ltd trading as Aplus Mortgage Solutions
ABN 49 111 011 182 P O Box 1335 Glen Waverley Victoria 3150
Telephone +61 3 9802 3322 Facsimile +61 3 9802 6654 Email aplus_ms@bigpond.net.au